# 2017 දෙසැම්බර් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"අන්ධකාරයෙහි ඇවිද්ද සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය.**
**ඝනඳුරු දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන් බැබළෙන්නේය"**

(යෙසායා 9:2)

ආගමන කාලය හෙවත් නත්තල් සමය එළඹී ඇත. ජේසු ක්‍රිස්තු සමිඳාණන් හෙවත් අපගේ ගැළවුම් කරුවාණන් වහන්සේගේ උපත සැමරීමට කිතුනු ජනතාව පමණක් නොව, සමස්ථ ලෝක ජනතාවම ඉතා ආශාවෙන් බලා සිටිති.

එදා දෙවියන් වහන්සේ තෝරාගත් ජනතාව විවිධ රජවරුන්ගෙන් පීඩා හිරිහැර මෙන්ම, ඔවුන් තුළ තිබූ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය හීන කර ගෙන වෙනත් දෙවිවරුන්ට පුද පූජා පැවැත්වූ සමයේ දෙවියන් වහන්සේ විවිධ දිවස්වරුන් මගින් ඔවුන්ට කථා කළ සේක. විශේෂයෙන් යෙසායා නමැති දිවැසිවරයා තුළින් මෙසියස් හෙවත් ගැළවුම් කාරයෙක් ඔවුන් වෙත එවන බවට වූ පොරොන්දුව අනුව ජේසු ක්‍රිස්තු සමිඳාණෝ මරිමව් කුසය තුළ ශුද්ධාත්මානුභාවයෙන් මාංශගත වී බෙත්ලෙහෙම් නුවර ගව මඩුවක උපන් සේක.

ඔවුන් වහන්සේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන ප්‍රකාශ කරමින්, ඔවුන්ට ආත්මික, ශාරීරික, මානසික සුවය දෙමින් ප්‍රධාන කොට ඔවුන්ගේ පාප වලට විපාකය කරට ගනිමින්, කුරුසියේ ඇණ ගසනු ලැබ, මරණයෙන් උත්ථාන වූයේ මුළු මිනිස් සංහතියටම ස්වර්ගයට ඇතුළු වීමට දොරටු විවෘත කරමිනි.

අයැදීමේ සේවකයන් වශයෙන් මේ මාසය පුරාවටම සමස්ථ කිතුනු ජනතාවට, නත්තල බාහිර උත්සවයක් වශයෙන් නොසලකා ඔවුන් වහන්සේව තම ජීවිතවලට ඇතුළු කරගෙන ඔවුන් වහන්සේගේ ප්‍රේමයේ සුභාරංචිය අද ලෞකික තෘෂ්ණාවෙන් අන්ධකාරයේ ජීවත් වෙන ජනතාව වෙතට ගෙන යෑමට අවැසි ශුද්ධාත්ම බලය පතා අඛණ්ඩව යාච්ඤා කරමු. මැදිහත් වෙමු.

**ක්‍රිස්තුන් වහන්සේව හමු වෙමු. අත්දකිමු.**

1. ඒකීය ක්‍රිස්තුන් වහන්සේ - කොලොස්සි 1:26-27 1කොරෙන්ති 3:11, 2කොරෙන්ති 5:17, පිලිප්පි 2:19, පිලිප්පි 2:5-11
2. සාංඝික ක්‍රිස්තුන් වහන්සේ - ශු.මතෙව් 18:19-20 හෙබ්‍රෙව් 4:15-16
3. දිව්‍ය සත්ප්‍රසාදීය ක්‍රිස්තුන් වහන්සේ - 1කොරෙන්ති 11:23-26 (දිව්‍ය පූජාව)
4. විශ්වීය ක්‍රිස්තුන් වහන්සේ - ශු.ලූක් 23:46 ශු.ජොහාන් 3:17 රෝම 8:34 2කොරෙන්ති 5:21

පළමු සතිය - දිව්‍යමය කියවීම - යෙසායා 9:2-7

අයැදීමට විශේෂ යොමුව :

ආගමන සමය තුළ නත්තල අර්ථවත්ව ගත කිරීම සඳහා සෑම කිතුනුවෙකුටම අවැසි ශුද්ධාතම බලය පතා අයැදිමු. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව, උපදේශක කමිටුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්.
* පුබුදුව තුළ දියත් කර ඇති ජුසේවාස් මෙහෙයුම හෙවත් අනගාරික දූත කාර්යය දේශය පුරා ගෙන යාමට අවැසි ශුද්ධාත්ම වරම් ලැබෙන පිණිස.
* වෙනත් අයැදීම්....

දෙවන සතිය - දිව්‍යමය කියවීම - යෙසායා 11:1-9

අයැදීමට විශේෂ යොමුව :

ජුසේවාස් මෙහෙයුම මුල් කරගෙන පුබුදුව තුළ ශ්‍රාවකත්වයේ කැඳවීම ලත් සියළු දෙනාට, ගම් නියම් ගම් සිසාරා ගොස් ප්‍රශංසාගම් බිහි කිරීමට අවැසි ශුද්ධාත්ම බලය ලැබෙන පිණිස.

(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* පුබුදු දිවිය ගත කර අද මහළු වී, ඔත්පල වී, රෝගී වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

තෙවන සතිය - දිව්‍යමය කියවීම - යෙසායා 60:1-6

අයැදීමට විශේෂ යොමුව :

අයැදීම් සහ මැදිහත්වීමේ සේවාවට සම්බන්ධ වී සිටින සියළු දෙනා සහ ප්‍රශංසාරාමයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභිමුව අඛණ්ඩ යාච්ඤාවෙන් පෙනී සිටින කුඩා කණ්ඩායම වෙනුවෙන් සහ අයැදීමේ සහ මැදිහත්වීමේ සේවාවට කැඳවීම ලැබෙන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* දිළිඳුන්, සරණාගත අය, සිර ගෙවල්වල සිටින අය, මහ මග සිඟමනේ යෙදෙන අය, මානසික රෝගීන්, වකුගඩු - පිලිකා - ඩෙංගු රෝගයෙන් පෙළෙන අය සහ වෛද්‍යවරුන්, සාත්තු සේවක සේවිකාවන් වෙනුවෙන් සහ රෝගීන්ට උපස්ථාන කරන සියළු දෙනා වෙනුවෙන්.
* පවුල් ජීවිතවල අර්බුදකාරී තත්ත්වයට පත් වී සිටින අය සහ මත්පැන්, මත් ද්‍රව්‍යවලට සහ විවිධ වහල්කම්වලට ඇබ්බැහි වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* දෙසැම්බර් මස 22,23,24 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන නත්තල් සම්මේලනයට සහභාගී වෙන සියළු දෙනා සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශවල අධ්‍යාපනය ලබන දරුවන් සහ ගුරුවර - ගුරුවරියන් වෙනුවෙන්.
* රජයේ රෝහල්වල සෞඛ්‍ය සේවාවේ නියැලෙන වෛද්‍යවරුන් සහ සාත්තු සේවක සේවිකාවන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

සතරවන සතිය - දිව්‍යමය කියවීම - යෙසායා 25:6-9

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :

* ශුද්ධෝත්තම පියතුමා ඇතුළු රදගුරු, පූජක, පැවිදි සහ ධර්මදූත සේවාවේ නියැලෙන සියළු දෙනා වෙනුවෙන්.
* කිතුනුකම නිසා පීඩා විඳින, මරණයට මුහුණ දෙන සියළු දෙනා වෙනුවෙන්.
* ලෞකික වටිනාකම් මුල් කරගෙන කිතුනුකමින් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

**"තව මද කලක් ආලෝකය ඔබ අතර පවතිනු ඇත. අන්ධකාරය ඔබ ග්‍රහණය නොකරන පිණිස, ආලෝකය තිබියදී ඇවිදින්න. අන්ධකාරයේ ඇවිදින තැනැත්තේ ඔහු යන්නේ කොහේදැයි නොදනී. ඔබ ආලෝකයේ පුත්‍රයන් වන පිණිස ඒ ආලෝකය අදහා ගන්න."**

(ශු.ජොහාන්12:38)

ශුභ නත්තලක් සහ ආලෝකමත් වසරක් වේවා !

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************